# ථේරවාදය, විභජ්ජවාදය සහ මුල් බුදුසමය

**මහාචාර්ය ඔලිවර් අබේනායක**

පරිවර්තනයඃ ඉලුක්කේවෙල ධම්මරතන හිමි

ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය, කැන්බෝඩියාව සහ ලාඕසය වැනි රටවල ථේරවාද සම්ප්‍රදාය ද චීනය, ජපානය, කොරියාව, වියට්නාමය සහ මොංගෝලියාව වැනි රටවල මහායාන බුදුදහම ද ව්‍යාප්තව පවතී. ථේරවාද යන්නෙහි අර්ථය හා එහි ආරම්භයත් පිළිබඳ මතවාද තවමත් සාකච්ඡා කොට අවසන් වී නැත. පැරණි හා නවීන පෙරාපර දෙදිග වෙසෙන බෞද්ධ විද්වත්හු මේ සම්බන්ධයෙන් තවදුරටත් බොහෝ වාද විවාදයන්හි එල්බ සිටිති. මේ අතරින්, ඇතැම් විද්වත්හු ථේරවාදය මුල් බුදුදහම (Original Buddhism) ලෙසත්, තවත් පිරිසක් එය මුල් බුදුදහමෙන් මතු වූ ගුරුකුලයක් ලෙසත්, අදහස් කරති. මෙම පත්‍රිකාවේ දී මාගේ උත්සාහය වන්නේ, පරම්පරාගත ව ථේරවාද බෞද්ධ රටවල මේ දක්වා පැමිණ ඇති 'ථේරවාද' යන පොදු ව්‍යවහාරය සැබෑ 'ථේරවාදය' යැයි ඉස්මතු කොට දැක්වීම යි. 'ථේරවාදය' යනු අන් කිසිවක් නොව, අවශ්‍යයෙන් ම දැක්විය යුතු ඓතිහාසික හා ධර්මානුකූල විග්‍රහයන්ගෙන් යුක්ත ව අඛණ්ඩ ව පැවත එන මුල් බුදුසමය යැයි මම මෙහි දී පැහැදිලි කිරීමට අපේක්ෂා කරමි. මා විසින් මෙම පත්‍රිකාවේ දී ගොනු කෙරෙන තොරතුරු ඇසුරින් ථේරවාදයට වඩා මුල් බුදුදහමට සමීප වූ වෙනත් බෞද්ධ සම්ප්‍රදායක් නොමැති බව තහවුරු කෙරේ.

**ථේරවාද යන්නෙහි අර්ථය**

පාලි සාහිත්‍යය ග්‍රන්ථයන්හි ථේරවාද යන්නට අදාළ කර ගත හැකි අර්ථ තුනක් දක්වෙයි. ඒවා නම්ඃ ''ස්ථිර බව'' (certainty), ''ථෙරීය මත'' (opinion of the elders) සහ ''නිර්මල බුදුදහම'' (the original doctrines of Buddhism).

''ස්ථිර බව'' යන ප්‍රථම අර්ථකථනය, සිද්ධාර්ථ කුමාරයාගේ මහාභිනිෂ්ක්‍රමණය පිළිබඳ කතාන්තරය අන්තර්ගත සූත්‍රයෙහි දක්නට ලැබේ. සිද්ධාර්ථ තාපසයා සත්‍ය සොයා යන ගමනේ දී ආලාරකාලාම හා උද්දකරාම යන තාපසවරුන් දෙදෙනා හමු වූ බව ප්‍රකට කරුණකි. එම කතාන්තරයට අනුව, ඔහු ආලාරකාලාම තාපසයාණන්ගෙන් ආකාසානඤ්චායතන භූමිය උගත් අතර, උද්දක තවුසාණන් විසින් අනාවරණය කරන ලද නේවසඤ්ඤානාසඤ්ඤායතන භූමිය දියුණු කරන ලදී. පසු කාලීන ව, මෙලෙස උපදවා ගන්නා ලද ධ්‍යානද්වය පිළිබඳ සිද්ධාර්ථ තාපසයාණන් තුළ ඇති වූ උද්යෝගය කෙබඳු දැයි බුදුරජාණන් වහන්සේ මෙසේ සිහිපත් කරයි. සෝකෝ අහං භික්ඛවේ තාවතකේනේව ඔට්ඨපහතමත්තේන ලපිතලාපනමත්තේන ඤාණවාදඤ්ච වදාමි ථේරවාදඤ්ච. 'ජානාමි පස්සාමි'[1] (මහණෙනි, ඒ මම නොබෝ දිනකින්ම ම ඒ ධර්මය ප්‍රගුණ කෙළෙමි. (ඒ මම උන් කී දැය පිළිගැනුමට) තොල් පහළ පමණින් ම, උන් කියූ දැය නැවත කීම් පමණෙකින්ම 'දනිමි'යි යන කථාවත්, 'මම එහි ස්ථිරයෙමි' යන කථාවත් කීවෙමි). ''සිද්ධාර්ථ තාපසයාණන් ආලාරකාලාම හා උද්දකරාම තවුසන්ගෙන් උගත් දැනුම නිශ්චිත හා ස්ථිර වූවක් ය'' යන අර්ථයෙන් මෙහි 'ථේරවාද' යන්න භාවිතා වී ඇත. ඒ අනුව එහි වාච්‍යාර්ථය නම්, 'ස්ථිරබව' යන්නයි. මජ්ඣිම නිකාය අට්ඨකථාව ද 'ථේරවදන්ති ථිරභාවවදං' යන්නෙන් මෙය තහවුරු කරයි.[2]

මෙහි එන දෙවන අර්ථය, බුද්ධඝෝෂ ආචාර්යන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද විනය පිටක අටුවාවක් වන සමන්තපාසාදිකාවෙහි දක්වා කොට ඇත. බුද්ධඝෝෂ ආචාරීන් වහන්සේ විනය සිව් අයුරකින් විග්‍රහ කරමින්[3] ආචරියවාද සහ ථේරවාද යන පදයන් විවිධාර්ථව යොදා ඇති බව ඉදිරිපත් කරති. 'ආචරියවාද' යනු රහතන් වහන්සේලා පන්සියයකගේ සහභාගීත්වයෙන් පවත්වන ලද ප්‍රථම ධර්ම සංගායනාවෙන් හා ඉන් අනතුරු ව සම්පාදනය කරන ලද පාලි ත්‍රිපිටකය අනුව ගොඩනගන ලද අටුවා සම්ප්‍රදාය (ආචරියවාදන්ති) යි.[4] මෙහි අර්ථවිවරණය කරන බුද්ධඝෝෂ ආචාරීන්වහන්සේ ''අත්තනෝමති'' (පුද්ගල ස්වමත) යන්න 'ථේරවාදය' හා සමාන කොට දක්වති. සූත්‍ර, විනය හා අභිධර්ම අටුවාවන්හි දක්වා ඇති ස්ථවිරවාදීන්ගේ අදහස් අත්තනෝමති යැයි මෙහි දී හඳුන්වා දිය හැකිය.[5] මේ අනුව, ථේරවාද (ස්ථවිරවාදී) යන්න අත්තෝමති යන්නට සමාන වූ පමණින්, ආචරියවාදී අටුවා සම්ප්‍රදාය අධිකාරීමය බලයකින් යුත් සම්ප්‍රදායයක් ලෙස පිළිගැනීම එතරම් සුදුසු නැත. විනය ටීකාවක් වන සාරත්ථදීපනිය ද පුද්ගලයන්ගේ ව්‍යක්ත විශාරද දැනුම මත පදනම් ව අත්තනෝමතියෙහි දක්නට ලැබෙන අධිකාරීත්වයෙහි දක්නට ලැබෙන දුර්වලතා ඉදිරිපත් කරයි.[6] විමතිවිනෝදනී නම් තවත් එක් විනය ටීකාවක් 'ථේරවාද' යනු මහාසුම්ම වැනි ස්ථරවිරවාදීන්ගේ අදහස් යැයි පෙන්වා දෙයි. ස්ථවිරවාදීන්ගේ එවැන් අදහස් අත්තනෝමති යැයි දක්වා, ඒවා සූත්‍ර ධර්ම හා එකඟ නොවන හෙයින් පරිශීලනයට නුසුදුසු ග්‍රන්ථ ලෙස හඳුන්වා දී ඇත.[7]

අධිකාරම් මහතා සඳහන් කරන පරිදි ආචරියවාද යනු අට්ඨකතාව බව මෙහි දී සඳහන් කළ යුතුය (ආචරියවාදෝ නාම අට්ඨකතා).[8] එමෙන් ම සත්‍යවශයෙන් ගත් විට එය දෙවැනි වන්නේ මූල ග්‍රන්ථයන්ට පමණි. ආචරියවාදය තුළ ඉදිරිපත් වන ඕනෑ ම අදහසක් සූත්‍ර හා එකඟ නොවන විට අටුවාව ද ප්‍රතික්ෂේප වේ.[9] සූත්‍ර පිටකයට අනුව, ආචරියවාදය සහ ථේරවාදය (= අත්තනෝමති) අධිකාරීත්වයේ වර්ධනීය පිළිවෙත නියෝජනය කරන්නකි.

තුන්වන අදහස අටුවා, ටීකා සහ වංශ කතා තුළින් ඉස්මතු වෙයි. අරහත් මිහිඳු හිමි ථේරවාදය ද ඇතුළත් ව සියලු අටුවා අරහත් මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගෙන් උගත් බව සමන්තපාසාදිකාව සඳහන් කරයි.[10] ථේරවාදය සහිත සමන්තපාසාදිකාව බුද්ධඝෝෂ හිමියන් විසින් සම්පාදනය කරන ලද බව උන්වහන්සේ විසින් ම අපට දන්වා ඇත.[11] ස්ථවිරවාන් විසින් පවත්වන ලද ප්‍රථම ධර්ම සංගායනාවේ දී සංගායනා කරන ලද ධර්මය හා විනය ථේරවාද ලෙස නම් කරන්නේ යැයි දීපවංශය වාර්තා කරයි.[12] සමස්ත විනය පිටකය අරහත් මිහිඳු හිමියන් විසිනුත්, සමස්ත ථේරවාදය අරහත් මොග්ගලීපුත්තතිස්ස හිමියනුත් උගත් බව දීපවංශය තවදුරටත් සඳහන් කරයි.[13] ප්‍රථම ධර්ම සංගායනාව ස්ථවිරවාදීන් විසින් සංගායනා කළ නිසා එය ථේරිය ලෙස නම් කර ඇතැයි මහාවංශය ද සඳහන් කරයි.[14] මහාවංශයට අනුව, බුද්ධඝෝෂ හිමි අනුරාධපුර මහා විහාරයේ දී ථේරවාදය මෙන් ම අටුවාව ද අධ්‍යයනය කළහ.[15] සමන්තපාසාදිකාවෙහි එන සඤ්ඤා කථං සබ්බං ථේරවාදං යන පාඨය විග්‍රහ කරන සාරත්ථදීපනී විනය අටුවාව, එහි අර්ථය ප්‍රථම හා ද්විතීය සංගායනාවලන් තහවුරු කර ගන්නා ලද අටුවා සහිත පෙළ දහම යැයි විග්‍රහ කරයි.[16] තවදුරටත් කරුණු ඉදිරිපත් කරන සාරත්ථදීපනිය, ප්‍රථම සංගායනාව, මහාකාශ්‍යප වැනි මහාස්ථවිරයන්ගේ මූලිකත්වයෙන් මෙහෙයවන ලද නිසා 'ථේරික' ලෙස සඳහන් කරන බවත්, දෙවන සංගායනාවට පසු බිහි වූ බෞද්ධ ගුරුකුල ථේරවාදය ගුරුකොට ගනිමින් බිහි වූ බව හඳුනාගත යුතු යැයි පෙන්වා දෙයි.[17]

ඉහත දක්වන ලද මූලාශ්‍රයයෙහි එන 'ථෙරවාද', 'ථෙරික' සහ 'ථෙරීය' යන යෙදුම් බෞද්ධ මතවාදය පමණක් නොව, බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව පවත්වන ලද ප්‍රථම ධර්ම සංගායනාවේ දී සංග්‍රහ කොට සම්පාදනය කර ලද ග්‍රන්ථ ද අනාවරණය කරයි. මේ යෙදුම් අත්‍යන්තයෙන් ම සැලකිල්ලට ගත් විට, ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමට පෙරාතු ව පවත්වන ලද ධර්මසංගායනාවන් දෙකේ දී ඒවා පුනර් අධ්‍යයනයන්ට, සම්පාදනයන්ට හා සංස්කරණයන්ට බඳුන් වී ඇත. මෙම ක්‍රියාවලියේ දී අටුවා සම්ප්‍රදාය අනිවාර්ය අංගයක් ලෙස ද සැලකිල්ලට ගෙන ඇති බව තවදුරටත් සඳහන් කළ හැකිය. ඉහත මූලාශ්‍රයයෙහි 'ථෙරවාද' යන්න 'බුදුදහමෙහි නිර්මල ධර්මය' යන පුළුල් අර්ථයෙන් භාවිත වෙයි. ඉහත සඳහන් කළ පරිදි, අටුවාවෙහි එන උපදේශය නම් පෙල දහම හා එකඟ නොවන ඕනෑ ම අර්ථකථනයක් ප්‍රතික්ෂේප කළ යුතුය යන්නයි. තවදුරටත්, ජනප්‍රිය ගුරුවරුන් විසින් ප්‍රකාශිත පුද්ගලබද්ධ අදහස් අටුවාවන් හෝ මූල ග්‍රන්ථ හෝ ඇසුරින් තහවුරු නොවන විට ඒවා ද සත්‍යය යැයි නොසැලකිය යුතුය.[18] එමනිසා, ථෙරවාදය 'බුදුදහමෙහි නිර්මල ධර්මය' ලෙස පිළිගැනීමේ දී ඒ සඳහා අභ්‍යන්තර වශයෙන් බලපාන කිසිදු පරස්පරතාවක් නො පවතින බව විශ්වාස කට යුතුය.

මෙහි දී, අටුවා ග්‍රන්ථයන්ට පටහැනිව 'ථෙරවාද' යන්න කවදා කෙසේ භාවිතයට පැමිණියේ ද යන්න සාකච්ඡා කිරීම මාතෘකාවට පරිබාහිර වූවක් නොවේ. 'බුදුදහමෙහි නිර්මල ධර්මය' උපාලි සහ ආනන්ද යන රහතන් වහන්සේගේ සහයෝගයෙන් හා මහාකාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ප්‍රථම ධර්ම සංගායනාවේ දී ආගමික ග්‍රන්ථ ලෙස සංග්‍රහ කොට සම්පාදනය කරන ලදී. එය කිසිදු අභියෝගයකට හෝ ප්‍රතික්ෂේප වීමකට හෝ බඳුන් නොවී අවුරුදු සිය ගණනක් පැවතුණි. කෙසේ වුව ද, කාලාශෝක රජුගේ රාජ්‍ය පාලන සමයේ දී වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලදැයි චුල්ලවග්ගපාලියෙහි එකළොස්වන පරිච්ඡේදයෙහි[19] සඳහන් වන දස අකැප වස්තුව හේතුකොට ගෙන හෝ ටිබෙට් සම්ප්‍රදායේ[20] සඳහන් වන මහාදේව මහරහතන් වහන්සේ විසින් නගන ලද පංච වස්තුව හේතු කොට ගෙන හෝ බෞද්ධ ඉතිහාසයේ ක්ෂණික විපතක් පැන නැගුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බුද්ධ ශාසනයෙහි ශාසනභාරධාරීන් අතර ප්‍රථම වතාවට නිකාය භේදයක් ඇති විය. චුල්ලවග්ගපාලිය විශ්වසනීය නම්, දසදහසකින් යුත් භික්ෂු කණ්ඩායමක් අරහත් මහාකාශ්‍යප, ආනන්ද සහ උපාලි යන භික්ෂු පරම්පරාවෙන් ඉස්මතු ව මහා සංඝික යැයි හඳුන්වන නව බෞද්ධ ගුරුකුලයක් ස්ථාපිත කිරීමට සමර්ථ වී ඇත. සබ්බකාමී, යස, රේවත යන රහතන් වහන්සේගේ මඟ පෙන්වීම යටතේ සුරක්ෂිත වූ මහාකාශ්‍යප වැනි ස්ථවිරවාදීන් විසින් ආරම්භ කරන ලද ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව එළඹි අර්බුධකාරී අවස්ථාවේ දී දස අකැප වස්තුවෙහි නොවටිනා බව පෙන්වා කරමින් ප්‍රථම ධර්ම සංගායනාවේ දී සංගායනා කොට සම්පාදනය කරන ලද ධර්මය සහ විනය යළි ස්ථාපිත කිරීමට සමර්ථ වූහ. සැලසුම් සහගත ව ක්‍රියාත්මක වූ තරුණ භික්ෂු කණ්ඩායමකගේ අභියෝගයන්ට ප්‍රතිචාර නොදක් වූ ස්ථවිරවිදීන් ථෙරවාදය ආරක්ෂා කොට පවත්වාගෙන යෑමට කටයුතු කළ හෙයින් 'බුදුදහමෙහි නිර්මල ධර්මය' ථෙරවාද යැයි හැඳින්වීමට පටන් ගත්තේය. මෙසේ අරහත් සබ්බකාමී, යස සහ රේවත යන රහත් හිමිවරුන් විසින් ස්ථාපනය කරන ලද සම්ප්‍රදාය තුන්වන ධර්ම සංගායනාවේ දී මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ විසින් නැවත ප්‍රතිසංවිධානය කරන ලදී.

එමනිසා ස්ථවිරවාදී පරම්පරාව විසින් බුදුදහම එසේ පෝෂණය කොට ආරක්ෂා කර තුන්වන ධර්ම සංගායනාවෙන් අනතුරු ව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන විට එය 'ථෙරවාද' යනුවෙන් හැඳින් වන ලද බව මවිතයට කරුණක් නොවේ.

'ථෙරවාදය' බුදුදහම ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට පෙරාතුව භාරතයෙහි ප්‍රභවය වී පෝෂණය වූ බෞද්ධ ගුරුකුල අතුරෙන් එක් ගුරුකුලයක් යැයි බොහෝ දෙනාගේ විසින් අනුමත කරන මතය මා මෙහි දී සාකච්ඡාවට නො ගන්නේ නම් මගේ මෙම ව්‍යායාමය අසාර්ථක වේ. අප දන්නා පරිදි, මහාසංඝික ගුරුකුලය, අටුවා, ටීකා සහ වංශකථා සම්ප්‍රදාය විසින් ථෙරවාදය ලෙස හඳුන්වනු ලබන 'බුදුදහමේ නිර්මල ධර්මය' ඇසුරින් පෝෂිත වූවකි. වැඩි කල් නො යත්ම ගොකුලික සහ ඒකබ්බෝහාරික ගුරුකුල දෙක සර්වාස්තිවාදයෙන් බිහිවිය. කාලයාගේ ඇවෑමෙන්, ගෝකුලිකයන්, පඤ්ඤත්තිවාදී සහ බාහුලික වශයෙන් දෙකඩ වූ අතර චේතියවාදය ඔවුන්ගෙන් බිහිවිය. මෙලෙස බිහිවූවෝ මහාසාංඝික ගුරුකුලයෙහි අනන්‍යතාවය හා ස්වෛරී පැවැත්ම ප්‍රතික්ෂේප නො කළහ. එමෙන් ම, කලින් කලට ඉස්මතු වූ වෙනත් විවධ ගුරුකුල සාර්ථකව ඉදිරියට පැමිණිය ද ඓතිහාසික හේතුන් මත ථෙරවාදය යැයි පසුකලෙක හඳුන්වන ලද 'බුදුදහමෙහි නිර්මල ධර්මය' පිළිබඳ පැවති අනන්‍යතාවය ගිලිහී යන්නට නොදී ආරක්ෂා කර ගත්තේ ය. ඉතිහාසය අපට උගන්වන පරිදි, මහීසාසක සහ වජ්ජිපුත්තකයෝ ථෙරවාදයෙන් බිඳී ගියහ. පසුව, ධම්මෝතරීය, භද්‍රයානික, ඡන්නාගරික සහ සම්මිතීය යන ගුරුකුල සතර වජ්ජිපුත්තකයින්ගෙන් බිහිවූ අතර මහීසාසක ගුරුකුලය ධම්මගුප්තික සහ සර්වාස්තිවාද යන ගුරුකුල බිහිකළේය. කාශ්‍යපීය සහ සංක්‍රාන්තික ගුරුකුල සර්වාස්තිවාද සම්ප්‍රදායෙහි අනුශාඛා ලෙස පිළිගැනේ. මෙම සංවර්ධනය සංක්‍රාන්තිකයන්ගේ සූත්‍රවාද ගුරුකුලයේ ප්‍රභවයත් සමග ම අවසන් වේ. බුදුදහමේ නිර්මල ධර්මය අතුරුදන් කිරීම සඳහා බෞද්ධ ගුරුකුල බහුත්වය හේතු නොවූ බව මෙම කෙටි පැහැදිලි කිරීමෙන් යෝජනා කෙරෙයි. මෙහි දී සිදුව ඇත්තේ, එක් ගුරුකුලයක් ගුරුකුල ගණනාවකට බෙදී යාමක් නොව, එකත් තවත් ගුරකුලයක් බිහිවීම සඳහා මුල් වීමකි. මෙකී ක්‍රියාවලියේ දී, සැබවින්ම, මූල ශාකය, අනු ශාඛාවන්ගේ බර දරාගනිමින් ම සුරක්ෂිත විය.

මේ හේතු කාරණා අනුව, පාලි නාකායාගතව සුරක්ෂිතව ඇති බුද්ධ වචනයත්, මුල්කාලීන ස්ථවිරවාදීන් විසින් ඒ සඳහා ලබා දෙන ලද අර්ථවිවරණත්, ඒ සඳහා ඉදිරිපත් වූ විවේචනයන්ට ඔවුන් විසින් ලබා දෙන ලද පිළිතුරුත් ථෙරවාදීහු සංස්ථාපනය කළහ. අරහත් මිහිඳු හිමියන් විසින් ලක්දිව මහාවිහාරයට හඳුන්වා දෙන ලද මේ වනවිට සුරක්ෂිතව පෝෂණය වී ඇති සම්ප්‍රදාය මෙය යි.

**ථෙරවාදය විභජ්ජවාදය ඇසුරින් හඳුනාගැනීම**

ශ්‍රී ලංකාවේ මෙන් ම මියෙන්මාරය, තායිලන්තය, කැම්බෝඩියාව සහ ලාඕසය යන රටවල 'ථෙරවාද' සහ 'විභජ්ජවාද' යන්න එකම බෞද්ධ සම්ප්‍රදායයක් සඳහා භාවිතා වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ථෙරවාද බුදුදහම සඳහා වඩාත් උචිත පදය 'විභජ්ජවාදය' යැයි සැලකේ. මෙම රටවල වාසය කරන බෞද්ධයන්, බුදුදහම විභජ්ජවාදය ලෙස හඳුනාගත් දා පටන්, එය විශ්ලේෂණාත්මක ධර්මයකැයි හඳුනාගෙන ඇත. දකුණු දිග සම්ප්‍රදායාගත බෞද්ධයන් විශ්වාසකරන පරිදි, බුදුදහම පිළිබඳව පමණක් නොව බුදුරජාණන් වහන්සේ පිළිබඳව ද හඳුන්වා දීම සඳහා ඒ සඳහා

අත්‍යන්තයෙන් ම උචිත වෙනත් යෙදුමක් නැත. තුන්වන ධර්ම සංගායනාවේ දී සම්පාදනය කරන ලද විනය අටුවා, කථාවත්තුප්පකරණය සහ ශ්‍රී ලාංකේය මහා වංශකථා ආදී පාලි මූලාශ්‍රය මත පදනම් ව 'ථෙරවාදය' සමග 'විභජ්ජවාදය' හඳුනාගැනේ. සමන්තපාසාදිකාව, කථාවත්තුප්පකරණය සහ මහාවංශය යන මූලාශ්‍රය තුන තුන්වන ධර්ම සංගායනාව පිළිබඳ තොරතුරු ප්‍රමාණාත්වක ලෙස වාර්ථා කරයි.[21]

හත්වන දිනයේ දී අශෝක රජතුමා අශෝකාරාමයට මහා සංඝයා ඒකරාශී කළේය. පෙර සූදානම් කරන ලද ප්‍රඥප්තියක් සඳහන් කරන ලද තිරදර්ශනයක් සහිතව එම ප්‍රඥප්පතිප්‍රකාරව ඔහු අසුන් ගත් අතර බහුවිධ මතිමාතන්තරයන්ගෙන් යුක්ත භික්ෂූන් වහන්සේගේ ස්වමතයන්ට උචිත පරිදි කණ්ඩායම් වීමට අවස්ථාව ලබා දුන්නේ ය. ඉන් අනතුරුව ඒ ඒ කණ්ඩායම්හි අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ''සම්මා සම්බුද්ධ කිනම් වාදී ගුරුවරයෙක් ද?'' යන ප්‍රශ්නය ඇසීය. එම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ශාස්වතවාදය විශ්වාස කළ අය බුදුරජාණන්වහන්සේ ශාස්වතවාදී යැයි සඳහන් කළහ. උච්ඡේදවාදය විශ්වාස කරන්නෝ බුදුරජාණන්වහන්සේ උච්ඡේදවාදී යැයි සඳහන් කළහ. එමෙන් ම, අන්තවත් හා අනන්තවත් ය යන න්‍යායෙහි පරතෙරට ගිය අඳ න්‍යාය අනුගමනය කරන්නන්, විතණ්ඩවාදීන්, සවිඤ්ඤාණක පැවැත්ම, අවිඤ්ඤාණක පැවැත්ම, සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක හෝ නොවන පැවැත්ම පිළිබඳ න්‍යායයන් පිළිගන්නවුන්, උච්ඡේදවාදීන් සහ මෙලොවදීම නිවන් ලැබුබේ යයි සඳහන් කරන්නන්වුන් ඔවුනොවුන් දූරු මතවාද අනුව පිළිතුරු ලබා දුණි. මේ අවස්ථාව වන විට ධර්මය පිළිබඳ මනා අවබෝධයක් ලබා සිටි රජතුමාට ඔවුන් බෞද්ධ භික්ෂූන් නොව අන්‍යලබ්ධිකයන් යැයි හඳුනාගැනීම දුෂ්කර කාර්යයක් වූයේ නැත. සංඛ්‍යාත්මක ව හැටදහසක් පමණ වූ මේ පිරිසට සුදු ඇඳුම් ලබා දී ඒ සියලු දෙනා ශාසනයෙන් නෙරපා දැමීය. ඉන් අනතුරු ව රජු ශේෂවූ සංඝයා ඒකරාශී කොට නැවත ද ''බුදුරජාණන්වහන්සේ කිනම්වාදී ගුරුවරයෙක් ද?'' යන ප්‍රශ්නය ම ඇසීය. එයට පිළිතුරු වශයෙන් ඔවුහු මෙසේ පැවසූහ. ''රජතුමනි, උන්වහන්සේ විභජ්ජවාදියෙකි.'' පිළිතුර එසේ වූ හෙයින් එය තහවුරු කර ගැනීම සඳහා මොග්ගලීපුත්තතිස්ස තෙරුන් වහන්සේගෙන් බුදුරජාණන්වහන්සේ විභජ්ජවාදී දැයි ඇසීය. ''එසේ ය මහරජ'' යයි තෙරුන් වහන්සේ පිළිතුරු දුන්හ. ඉන් අනතුරුව, අශෝක රජතුමා, ''ස්වාමීනී, ශාසනය දැන් පිරිසිදුයි එසේ හෙයින් භික්ෂූන්ට උපෝසථ කර්මය සිදු කිරීම සඳහා අවසර ලබා දෙන්න'' යැයි ස්ථවිරයන් වහන්සේට පැවසීය. හැට දහසක් භික්ෂූන් වහන්සේගෙන් යුත් මෙම සභාවේ දී දුර්මත ප්‍රතික්ෂේප කිරීම සඳහා කථාවත්ථුප්පකරණය නම් වූ ග්‍රන්ථය මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ දේශනා කළහ.

උක්ත කරුණු අනුව බුදුරජාණන්වහන්සේ විභජ්ජවාදීයෙකු ලෙසත්, උන්වහන්සේගේ ඉගැන්වීම් විභජ්ජවාදී ලෙසත් හඳුනාගන්නා ලදී. මෙය බුදුරජාණන් වහන්සේගේ සත්‍ය ස්වරූපය යැයි සැලකූ අතර සියලු ම ආගමික න්‍යායන්ගෙන් හා දුර්මතයන්ගෙන් වෙන් වූ මුල් බුදුසමයාගත ඉගැන්වීම් උන්වහන්සේගේ ඉගැන්වීම් යැයි සැලකීය. එසේ වුව ද තායිලන්තය, මියන්මාරය සහ ශ්‍රී ලංකාව යන රටවල වෙසෙන බෞද්ධයන් විසින් ඉතා ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගන්නා ලද මෙම විභජ්ජවාද යන පදය පෙල දහම තහවුරු නොකරයි. භාවක්‍රියාවක් වන 'විභජ්ජ' යන යෙදුම බුදුරජාණන්වහන්සේගේ ධර්ම දේශනා කිරීමේ චතුර්විධ ක්‍රමවේද පැහැදිලි කරන සූත්‍රයන්හි ඉතා කලාතුරකින් හමුවන්නකි.[22] චතුර්විධ ප්‍රශ්න ව්‍යාකරණය යනු

1. පඤ්හෝ ඒකංස ව්‍යාකරණීයෝ - එකවිට පිළිතුරු දිය යුතු ප්‍රශ්න
2. පඤ්හෝ පටිපුච්චා ව්‍යාකරණීයෝ - කෙටි ප්‍රශ්න නගමින් පිළිතුරු දිය යුතු ප්‍රශ්න
3. පඤ්හෝ ඨපනීයෝ - පසෙකින් තැබිය යුතු ප්‍රශ්න
4. පඤ්හෝ විභජ්ජ ව්‍යාකරණීයෝ - විග්‍රහ කරමින් පිළිතුරු දිය යුතු ප්‍රශ්න

බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරමින් ප්‍රශ්නවලට පිළිතුරු දීමේ ක්‍රමවේදය නිතර භාවිතා කොට නැති බව මේ විග්‍රහය අනුව පෙනේ. උන්වහන්සේගේ පිළිතුර ප්‍රශ්නයේ ස්වභාවය මත පිහිටයි. එකවිට පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට විග්‍රහාත්මක ව පැහැදිලි කිරීමක් බුදුරජාණන්වහන්සේ විසින් කිසි විටෙක සිදු නොකරන ලදී. එසේ ම කෙටි ප්‍රශ්න නගමින් පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට හෝ පසෙකින් තැබිය යුතු ප්‍රශ්නයකට හෝ විග්‍රහාත්මකව ද පිළිතුරු දී නැත. එමනිසා, විග්‍රහ කොට ධර්මය දේශනාකිරීම චතුර්විධ ප්‍රශ්න ව්‍යාකරණයේ දී ඒකායන ක්‍රමවේදය ලෙස බුදුදහමෙහි භාවිත නොවේ.

එකවර පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට එකවර පිළිතුරු නොදෙන පුද්ගලයා, විග්‍රහ කොට පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට විග්‍රහ කොට පිළිතුරු ලබා නොදෙන පුද්ගලයා, කෙටි ප්‍රශ්න නගමින් පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට කෙටි ප්‍රශ්න නගමින් පිළිතුරු නොදෙන පුද්ගලයා සහ පසෙකින් තැබිය යුතු ප්‍රශ්නයක් පසෙකින් නොතබන පුද්ගලයා යන අය සමග සාකච්ඡා කිරීම හෝ විවාද කිරීම හෝ සුදුසු වන්නේ නැතැයි අංගුත්තර නිකාය සඳහන් කරයි.[23] මේ අනුව, බුදුරජාණන්වහන්සේ විභජ්ජවාදී යැයි සඳහන් කරන ප්‍රකාශයට අනුව, උන්වහන්සේ ඒකංශවාදී, පටිපුච්චවාදී එමෙන් ම ඨපනීයවදී ද වේ යන නිගමනයට එළඹිය හැකිය.

මෙම නිගමනය, මජ්ඣිම නිකායේ සුභ සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ විභජ්ජවාදී යැයි උන්වහන්සේ විසින් ම කෙරෙන ප්‍රකාශයකින් තවදුරටත් සාකච්ඡා කළ හැකිය. බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයේ දී තෝදෙය්‍ය බ්‍රාහ්මණයාගේ තරුණ පුතෙක් වන සුබ උන්වහන්සේ වෙත පැමිණ පහත සඳහන් ප්‍රශ්න දෙක ඇසීය.

1. ප්‍රව්‍රජිත තෙමේ නිරවද්‍ය, න්‍යාය ධර්මය පුරන්නේ වුවද ගෘහස්ථ තෙමේ නොපුරන්නේ යැයි බමුණෝ කියති. මේ පිළිබඳ ව ඔබ වහන්සේට ප්‍රකාශ කිරීමට ඇත්තේ කුමක් ද?

2. බොහෝ අර්ථ ඇති, බොහෝ වූ කිස ඇති, බොහෝ වූ අධිකාරි ඇති එමෙන් ම බොහෝ වූ සමාරම්භ ඇති ගෘහ වාසය කුටුම්භක කාර්යයක් මිස එය තාපසයන්ගේ බැඳීමක් නොවේ යැයි බ්‍රාහ්මණයෝ සඳහන් කරති. මේ පිළිබඳ ව ඔබ වහන්සේට ප්‍රකාශ කිරීමට ඇත්තේ කුමක් ද?[24]

බුදුරජාණන්වහන්සේ මේ ප්‍රශ්න දෙකට එකවිට පිළිතුරු දිය යුතු ක්‍රමවේදය භාවිතා නො කොට පිළිතුරු දුන්හ. මේ ප්‍රශ්න දෙක පිළිබඳ ව උන්වහන්සේගේ පිළිතුර පහත සඳහන් පරිදි දෙවතාවක් ඉදිරිපත් වී ඇත. මේ පිළිබඳ ව ''තරුණය, මම ඔබට විග්‍රහත්මක පිළිතුරක් ලබා දෙමි. මෙහි දී මම එකවිට පිළිතුරු දීමක් නොකරමි. (විභජ්ජවාදො බො අහමෙත්ථ මානවා නහමෙත්ථ ඒකංසවාදො). මේ පිළිතුරෙහි එන 'මෙහි' (එත්ත) යන පදයෙන් අර්ථවත් වන බුදුරජාණන්වහන්සේගේ ස්ථාවරය හා විචාර පූර්ව ආකල්පය අවධාරණය වන හෙයින් එම පදයෙහි ඇති වැදගත්කම නොසලකා හැරිය නොහැකිය. සුභ නගන ලද ප්‍රශ්න දෙකට බුදුරජාණන්වහන්සේ ලබා දුන් පිළිතුර අනුව පමණක්

යමින් උන්වහන්සේ විභජ්ජවාදයෙහි ප්‍රවීනයෙක් යැයි සුවිශේෂී කොට දැක්විය හැකිය. මෙහි දී ප්‍රකට වන කරුණ නම් බුදුරජාණන් වහන්සේ විවිධ වූ වෙනත් ප්‍රස්තුතයන්ට ඒකංශ ව්‍යාකරණීය වශයෙන් පිළිතුරු ලබා දෙන බව යි. පොට්ටපාදට පිළිතුරු ලබා දෙමින්, බුදුරජාණන් වහන්සේ වරක් දේශනා කරන ලද්දේ: මම ඒකංශ ව්‍යාකරණීය වශයෙන් පිළිතුරු දිය හැකි ප්‍රශ්නය සඳහා ධර්මය දේශනා කොට උගන්වමි, එමෙන් ම මම ඒකංශ ව්‍යාකරණීය වශයෙන් පිළිතුරු ලබා දීමට නො හැකි ප්‍රස්තුතයන් සඳහා ද ධර්මය දේශනා කොට උගන්වමි.[25] එමනිසා, බුදුරජාණන්වහන්සේ සියලු ආකාරයේ ප්‍රස්තුතයන් සඳහා විභජ්ජවාදමය ක්‍රමය භාවිතා කළේ යැයි සඳහන් කිරීම ප්‍රමාණවත් නොවේ. ප්‍රශ්නයේ ස්වභාවය අනුව උන්වහන්සේගේ පිළිතුර විවිධ වෙයි. උන්වහන්සේගේ ප්‍රකාශ ඇතැම් විට ඒකංශ ව්‍යාකරණීය යි. ඇතැම් විට විභජ්ජ ව්‍යාකරණීය යි. එමනිසා, බුදුරජාණන් වහන්සේ විභජ්ජවාදී යැයි සාම්ප්‍රදායික ව කෙරෙන ප්‍රකාශයට පෙළ දහම සාක්ෂි නො සපයයි.

කෙසේ වුව ද, සමන්තපාසාදිකාව, කථාවත්ථු අට්ඨකතාව සහ මහාවංශය යන ග්‍රන්ථයන්හි එන සඳහනට අනුව, බුදුරජාණන්වහන්සේ විභජ්ජවාදී යැයි ඓතිහාසිකව කෙරෙන සඳහන අසත්‍ය යැයි නොසලකා හැරිය නොහැකිය. සංස්කෘත හා චීන මූලාශ්‍රයෙහි මේ පිළිබඳව සඳහන් වන කරුණුවලට අනුව මෙහි දක්වන ඓතිහාසිකත්වය සුවිශේෂය. මහාචාර්ය වයි. කරුණාදාස මහතා විසින් මෙම මාතෘකාවට සම්බන්ධව රචනා කරන ලද 'උතුරු බුදුසමයාගත මූලාශ්‍රයන්හි භාවිත විභජ්ජවාද යන්නෙහි අරුත' යන ශාස්ත්‍රීය ලිපියෙහි එය පහත සඳහන් පරිදි පැහැදිලි කොට ඇත.

''ආචාර්ය වසුබන්ධුගේ අභිධර්මකෝෂභාශ්‍යයෙහි සහ හරිවර්මන්ගේ සත්‍යසිද්ධි ශාස්ත්‍රයෙහි චීන සංස්කරණයෙහි මෙසේ දක්වෙයි. උදාහරණ වශයෙන්, බෞද්ධයන් අතර විභජ්ජවාදීන් යනු ගුණාත්මක පිළිතුරක් ලබා දෙන්නන් ය, යම් විදියකින් තහවුරු කළ හැකි පිළිතුරක් ලබා දෙන්නන්, අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයෙහි පවත්නා පරමාර්ථ ධර්ම හෝ ප්‍රස්තුතයට අනුව එසේ සඳහන් කරන ධර්ම - අශෝක රජුගේ කාලය අතර තුර හා ඉන් පසු බෞද්ධ ගුරුකුලයන්ගේ සංවර්ධනය සිදු වන යුගයේ දී ඊට බාධා කළ පරස්පර විරෝධී අර්බුදයක්. ග්‍රන්ථ වශයෙන් වෙනස් වූ විභජ්ජවාදී ලෙස නම් කෙරෙන බෞද්ධ ගුරුකුලයන්ට නමකි. විවිධ මූලාශ්‍රයෙහි සඳහන් නම් අතර කස්සපීය, ප්‍රඥප්තිවාද, මහීසාසක, ඒකව්‍යවහාරික සහ ලෝකෝත්තරවාද යන නම් දක්නට ලැබේ. අභිධර්මකෝෂාභාශ්‍යයෙහි චීන සංස්කරණයෙහි ප්‍රංශ පරිවර්තනයේ දී ආත්මවාදී සමානකමකින් යුත් වාද ප්‍රකාශයෙහි ස්ථවාරය හේතුවෙන් ථෙරවාදීන් ද විභජ්ජවාදීන් ලෙස සැලකීම සඳහා අවශ්‍ය ශක්‍යතා පවත්නා බව ලා වැලි පොසින් සඳහන් කරයි. මෙම නිගමනයට පක්ෂ ව ථෙරවාදී සාහිත්‍යය මූලාශ්‍රයයෙහි ම බොහෝ ඍජු තොරතුරු ඇත.

තවදුරටත්, මුලින් සඳහන් කරන ලද තුන්වන ධර්ම සංගායනාවට අදාළ තොරතුරුවලට ඍජු ලෙස ම අදාළ නොවූ, නමුත් වැරදීමක් යැයි ප්‍රකාශකළ නොහැකි, කාලෝචිතවූ, එමෙන් ම ථෙරවාදය විභජ්ජවාදය යැයි අපට පහසුවෙන් හඳුනාගත හැකි, බෞද්ධ විවාදයන්ට අනුව පමණක් ම නොව තුන්වන ධර්ම සංගායනාවේ දී ගන්නා ලද තීරණ සත්‍යෙක්ෂණය කිරීමක් ද වේ.

ඓතිහාසික සංසිද්ධීන් සහ සත්‍ය යැයි උකහාගත හැකි මතවාද ගොඩනගන ධර්මමය හේතු සාධක හෝ ධර්මයන්ගේ ත්‍රිකාලික පැවැත්ම සඳහා ඉවහල් වන ධර්ම, සහ තදනන්තර ශාසනයේ ඓතිහාසිකත්ව කෙරෙහි ඇති කළ බලපෑම, තුන්වන ධර්ම සංගායනාවෙන් අනතුරු ව එළඹි සියවස්

දෙක තුළ ගොඩනැගුණු බෞද්ධ ඉතිහාසය පිළිබඳව ඉතා සමීපව අප අධ්‍යයනය කරන්නේ නම් පැහැදිලි වේ.[26]

පහත සඳහන් සමාලෝචනය බුදුරජාණන්වහන්සේ විභජ්ජවාදී යැයි ද බුදුදහම විභජ්ජවාදයකැයි ද හඳුනාගැනීම සඳහා මුල් බුදුසමයෙහි සැබෑ උරුමකරුවා වන ථෙරවාදය ද ඇතුළත් ව තවත් බොහෝ බෞද්ධ ගුරුකුල ඉවහල් වූ බව හඳුනාගැනීම සඳහා ඉවහල් වන ඓතිහාසික පසුබිම පිළිබඳ සමාලෝචනයකි. සූත්‍ර ධර්ම ස්වරූපයෙන් පැවති බුදුරජාණන්වහන්සේගේ ඉගැන්වීම් වඩා විධිමත් ලෙස සංග්‍රහ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අභිධර්මය බිහි වූ බව පොදු විශ්වාසය යි. මුල්බුදුසමයාගත ඉගැන්වීම් සංග්‍රහ කොට විග්‍රහ කිරීමේ දී ධර්මවාදය ලෙස පිළිගැනෙන ධර්ම න්‍යායයකි අභිධර්මය. මෙම න්‍යායට අනුව, සත්‍යාර්ත වශයෙන් පවතින්නේ ධර්ම පමණි. එමනිසා, පුද්ගල පැවැත්ම ප්‍රතික්ෂේප විය. මෙම පදනමට අනුව, ජීවිතයේ අඛණ්ඩ පැවැත්ම හා සදාචාරාත්මක වගවීම ප්‍රතික්ෂේප වූ තැන් පටන් ධර්ම න්‍යාය ප්‍රශ්නකාරී විය. පුද්ගල යන්නෙහි පැවැත්ම නැත්නම් හොඳ නරක ක්‍රියාවන්ගේ වගකීම ලබා ගැනීම සඳහා කිසිවෙකුත් නොමැති වනවා සේම මෙම ආත්මභාවයේ සිට ඊළඟ ආත්මභාවය සඳහා ගමන් කරන්නෙක් ද නොමැති වේ. මේ මතය ක්‍රියාත්මක කළ අය ගුරුකුලයක් වශයෙන් වෙන් වූ අතර අශෝක රජුගේ පියා වූ බිම්බිසාර රජුගේ රාජ්‍ය සමයේ දී ථෙරවාදයෙන් බිහි වූ අන්‍ය ගුරුකුලයක් ලෙස ස්ථාවර විය. මෙම ගුරුකුලය පුද්ගලවාදය ලෙස නම් කෙරිණි. වාට්සපුත්‍රීය ආචාර්යවරයාගෙන් බිහි වූ හෙයින් මෙම ගුරුකුලය වාට්සපුත්‍රීය නිකාය යනුවෙන් ද හැඳින්වේ. පුද්ගලවාදය වාස්තවික න්‍යායක් යැයි අවතක්සේරුවට ලක්විය. මෙය පුද්ගල යන්නෙහි පැවැත්ම පිළිගැනීම වෙනුවට, පුද්ගලවාදය බිහි වීම සඳහා හේතු වූ ගැටලුවලට පිළිතුරු දීමට දරන උත්සාහයක ප්‍රතිඵලය කි. මෙම ප්‍රයන්තනයේ ප්‍රතිඵලය වූයේ සර්වාස්ථිවාද ලෙස සැලකෙන නව න්‍යායක් සොයා ගැනීමයි. සර්වාස්ථිවාද ගුරුකුලය බින්දුසාර රජුගෙන් පසු ඔහුගේ පුත් අශෝක රජ්‍ය සමයෙහි දී ආරම්භ විය. සර්වාස්තිවාදීහු සදාචාරාත්මක වගකීම පිළිබඳ ගැටලුව සහ ජීවිතයෙහි පැවැත්ම පිළිබඳ ගැටලුව පුද්ගලයාගේ පැවැත්ම පිළිබඳව සඳහන් කිරීමකින් තොරව ධර්මයන්ගේ ත්‍රිකාලික පැවැත්ම ඔස්සේ තහවුරු කළ හැකි බව සඳහන් කළහ. සියලු ධර්මයන් කාලත්‍රයෙහි පවතී දැයි සර්වස්ථිවාදීන් විසින් ඉදිරිපත් කරන ලද ගැටලුවට ඒකංශ ව්‍යාකරණීය වශයෙන් පිළිතුරු සපයමින් ධර්මයන් පවතීයැයි පවසූහ.

ධර්මයන්ගේ ත්‍රිකාලික පැවැත්ම, ආත්ම සංකල්පයට සපක්ෂව වූ පාරභෞතික සංකල්පයක් ඉදිරිපත් කිරීම නිසා, අශෝක රජුගේ කාලයේ දී ''සියලු ධර්ම විශ්ලේෂණාත්මකට පවතීද'' යන ගැටලුවට පිළිතුරු ද සපයාගනිමින් තවත් ගුරුකුලයක් බිහි විය. මෙම ගුරුකුලය මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් මෙහෙයවන ලද හෙයින් එය 'කශ්‍යපීය' ලෙස නම් කෙරුණි. කශ්‍යපීය ගුරුකුලයෙහි ස්ථාවරය වූයේ වර්තමානයෙහි පවත්නා එමෙන් ම මෙතෙක් සක්‍රීය නොවූ විපාක අතීත ධර්ම වේ, එසේ ම අනාගතයෙහි නොපවතින මේ වන විට සක්‍රීය වූ විපාක අතීත ධර්ම වේ, යන්න යි. ධර්මයන්ගේ ත්‍රිකාලික පැවැත්ම පිළිබඳ ගැටලුව විවරණය කෙරන මෙම විග්‍රහයෙන් නිසා, ඒකංශව්‍යාකරණීය වශයෙන් කෙරෙන නිගමනයක් සඳහා අස්ථ්‍යාර්ථයෙන් හෝ නස්ථ්‍යාර්ථයෙන් හෝ නො දක්වමින්, එය විභජ්ජවාදී යැයි හඳුන්වනු ලැබේ.[27]

මේ අනුව, අශෝක රාජ්‍ය සමයේ දී අභිධර්මික ධර්ම විග්‍රහය හේතු කොටගෙන පුද්ගලයාගේ පැවැත්ම පිළිබඳව ඇති වූ ධර්ම ගැටලු උණුසුම් ව විවාදයට ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ගුරුකුල තුනක් බිහි විය. මෙය කශ්‍යපීය, සර්වාස්ථිවාද සහ වාට්සීපුත්‍රීය නිකායිකයන් විසින් ථෙරවාදයට අයත් ස්ථවිරවාදීන්ට ඔවුන්ගේ ස්ථාවරය නැවත නිර්වචනය කිරීමට කරල ලද බලපෑමක් විය. තුන්වන ධර්ම සංගායනාවේ දී රචනා කරන ලද කථාවත්ථුප්පකරණයෙහි පළමු පරිච්ඡේදයේ පුද්ගල කතාවෙහි එය විග්‍රහ වෙයි. එහි දී අරහත් මොග්ගලීපුත්තතිස්ස තෙරුන් වහන්සේ විසින් කාලය, අවකාශය සහ යථාර්ථය පදනම් කර ගනිමින් සකාරණ ව ආවසානික වශයෙන් ඉතා හොඳින් පැහැදිලි කරයි. මෙම විභජ්ජවාදී එළඹුම එකල පැවති මතවාදයට සහේතුක වූ හෙයින් ථෙරවාදය ද විභජ්ජවාද යැයි හැඳින්වීමට පටන් ගත්තේ ය. පෙර සඳහන් කළ පරිදි, පාලි මූලාශ්‍රයයෙහි එන ථෙරවාදය යන්න පුද්ගලබද්ධ ව්‍යවහාරයක් ලෙස ගත්ත ද විවිධ බෞද්ධ ගුරුකුලයන්හි විෂයක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන දෙන ලද පොදු නාමයකි 'විභජ්ජවාද' යන්න.

සැ.යු.

මෙම ලිපියෙහි විශේෂ සඳහනක් නොමැතිව භාවිතා කොට ඇති පාලි ග්‍රන්ථ ලන්ඩනයේ පාලි ග්‍රන්ථ සමාගම විසින් ප්‍රකාශිත ඒවා ය.

---

[1] ම.නි. I, 164 පිටුව
[2] පපඤ්චසූදනී (විනය අටුවාව), II. 171 පිටුව
[3] චතුර්විධ විග්‍රහය යනු සුත්ත, සුත්තානුලෝම, ආචරියවාද සහ අත්තනෝමති යන්න යි.
සමන්තපාසාදිකා (විනය අටුවාව). I. 230 පිටුව
[4] එම 231 පිටුව
ධම්මසංගහකේහි පඤ්චහි අරහන්තසතෙහි ඨපිතපලිවිනිම්මුත්ථ ඔක්කන්තිකවිනිච්ඡයප්පවත්ත අට්ඨකථා තන්ති.
[5] එම
[6] සාරත්ථදීපනී, සංස්. දේවරක්ඛිත ස්ථවිර, 1933, 430 පිටුව.
[7] විමතිවිනෝදනී, සංස්. ධම්මධර ස්ථවිර, 1935, 103 පිටුව.
[8] සුමංගලවිලාසනී. II. 567: විසුද්ධිමාර්ගය. I. 96 පිටුව.
[9] සුමංගලවිලාසනී. II. 568: බලන්න, Adikaram, E.W., Early History of Buddhism in Ceylon, 1946. p.15
[10] සමන්තපාසාදිකා, I. 30ff.
[11] එම
[12] දීපවංශය, 4වන පරිච්ඡේදය
[13] එම, 5වන පරිච්ඡේදය
[14] මහාවංශය, 3වන සහ 5වන පරිච්ඡේද
[15] එම. 37වන පරිච්ඡේදය
[16] සාරත්ථදීපනී, 113 පිටුව
[17] එම 90 පිටුව, ff.
[18] විසුද්ධිමාර්ගය, I. 107 පිටුව.

[19] චුල්ලවග්ගය, 11වන පරිච්ඡේදය
[20] Rockhill, W.W., Life of the Buddha, London, 1884, p.181
Poussin, Louis De la, The Five Points of Mahadeva and Kathavatthu, JRAS, London, 1910, p.414
[21] සමන්තපාසාදිකාව, I. 30ff; කථාවත්ථුකථා, JPTS, 1889, pp.5-7; මහාවංශය, 5වන පරිච්ඡේදය
[22] දීඝනිකාය, III. 229; අංගුත්තරනිකාය, II. 45
[23] අංගුත්තරනිකාය, I. 197
[24] මජ්ඣිමනිකාය, II, 197
[25] දීඝනිකාය, I. 189-191
[26] කල්‍යාණී, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා සඟරාව, කැලණිය විශ්වවිද්‍යාලය, 1983, 9-10 පිටු
[27] Rockhill, W.W., Life of the Buddha, London, 1884, p.91ff.
Masuda, J., Origin and Doctrines of Ealry Indian Buddhist Schools, Asia Major, Vol. II, 1925, pp. 65ff.